# ශ්‍රී ලාංකීය බෞද්ධ භික්ෂුවගේ සාමාජීය කාර්යභාරය

කේ. ඒ. එස්. ප්‍රියදර්ශනි.
විශේෂවේදී තෙවන වසර
ඉතිහාසය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
samanthikaku@gmail.com

**සංක්ෂේපය**

අශෝක අධිරාජයාගේ හා එවකට ලාංකීය රජු වූ දේවානම් පියතිස්ස රජුගේ මිත්‍රත්වය හේතු කොට ගෙන ලංකාවට මිහිඳු හිමිගේ වැඩමවීමත් සමඟ ලාංකිකයන්ටද නිර්මල දහමක් ලැබුණි. ඒ අනුව ක්‍රමයෙන් මෙරට සංඝ සමාජය ආරම්භ විය. කල්යාමේදී සංඝ සමාජය සමාජයේ සෑම කටයුත්තක් සඳහාම දායකත්වය සැපයීය. අධ්‍යාපන, ආර්ථික, දේශපාලන, සාහිත්‍ය ආදී ලෙස මෙම අංශ හැඳින්විය හැකිය.

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ මෙසේ ආරම්භ වූ භික්ෂු සමාජයේ සාමාජීය වගකීම කෙබඳුවීද යන්න හා එමගින් සමාජය දියුණු වූ ආකාරය අධ්‍යයනය කිරීමයි. ප්‍රාථමික මූලාශ්‍රය මෙන්ම, ද්විතීය මූලාශ්‍රයන් ද මෙම පර්යේෂණයේ ක්‍රමවේදය වශයෙන් යොදා ගනු ලැබීය.

පැවිදි භික්ෂුව උපසම්පදා විනය කර්මයෙන් ශ්‍රාවක සංඝ ගණයට ඇතුළත් වන අතර, මෙසේ ශ්‍රාවක සංඝ ගණයට ඇතුළත් වීමෙන් පසු භික්ෂුව සමාජයේ සියලුම කාර්යයන්හි ප්‍රමුඛත්වය ගෙන කටයුතු කරනු ලබයි. අනුරාධපුර යුගයේ සිට මේ දක්වා භික්ෂුවගේ කාර්යභාරය මේ ආකාරයට සිදුව තිබේ. ආරාමයට මෙන්ම භික්ෂුවටද එමඟින් සමාජයේ ගෞරවනීය ස්ථානයක් උදාවී ඇත. ශ්‍රී ලංකාවේ භික්ෂු සමාජය ආරම්භ වීමත් සමඟ සමාජය ගිහි පැවිදි වශයෙන් කොටස් දෙකකින් යුක්ත වූ අතර, ගිහියාගේ මෙලොව පරලොව උභයාර්ථ සංවර්ධනය උදෙසා මහගු කාර්යය භාරයක් භික්ෂුවගෙන් ඉටුවූ බව මූලාශ්‍රයගත කරුණු විමසීමේ දී පැහැදිලි වේ.

**ප්‍රමුඛ පද: භික්ෂුව, කාර්යභාරය, සමාජය.**